WATCHLIST ON CHILDREN AND ARMED CONFLICT


Watchlist

# ආරක්ෂාව ද නැත ගැලවීමක් ද නැත:
## ශ්‍රී ලංකාවේ ළමුන් සහ උත්සන්න වන සන්නද්ධ ගැටුම

පසුගිය දශක දෙක තුළ 67,000 කට අධික සිවිල් වැසියන්ට මරු කැඳවා තිබෙන හා ශ්‍රී ලංකාවේ ජනයා අතර කිව නොහැකි තරම් පීඩාවක් ඇතිකර තිබෙන මෘග සන්නද්ධ ගැටුමකට ශ්‍රී ලංකාවේ ළමයි ද  මැදිවී සිටිති. ශ්‍රී ලංකා  ආණ්ඩුවේ හමුදා විසින් ද දෙමළ ඊලාම් විමුක්ති කොටි හා දෙමළ ජනතා විමුක්ති කොටි (TMVP) /කරුණා කණ්ඩායම වැනි කැඩී ගිය සන්නද්ධ කණ්ඩායම් විසින් ද කරනු ලබන සාහසික මානව හිමිකම් උල්ලංගනයන් රට පුරාම නිරන්තර භීතියේ හා අනාරක්ෂිත භාවයේ වාතාවරණයක් නිර්මාණය කර තිබේ.

ශ්‍රී ලංකා ආණ්ඩුව  හා එල්ටීටීය  යන දෙකම උතුරේ යාපන අර්ධද්වීපය හා වන්නි ප්‍රදේශයට ද නැගෙනහිර සමහර ප්‍රදේශ හා ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් අධි ආරක්ෂිත කලාප යැයි ප්‍රකාශකර ඇති ප්‍රදේශවලට ද අත්‍යාවශ්‍ය මානුෂීය ආධාර බෙදාහැරීම සීමා කර හෝ වළකා ලනු ලැබ හෝ තිබේ. සැලකිය යුතු තරම් වූ පරිපාලනමය බාධක වලට අමතරව මානුෂවාදී හා මානව හිමිකම් කාර්යධරයන් ඔවුන්ගේ ජීවිතාරක්ෂක කටයුතු කරගෙන යද්දී හිරිහැරයට, තර්ජනයට හා ඝාතනයට පවා භාජනය කිරීම වැඩි වෙමින් පවතී. ඊට අමතරව සාමාන්‍ය වැසියන්ගේ ගමනාගමනය මත පනවනු ලබන සීමාවන් මගින් ඔවුන් ආරක්ෂාව පතා ගැලවී යාමෙන් හෝ ආධාර ලබාගැනීමෙන් වලකනු ලැබීම හේතු කොටගෙන මානුෂවාදී අර්බුදය තව තවත් උත්සන්න කර තිබේ. අපරාධකරුවෝ දඬුවම් ලැබීමෙන් තොරව ළමුන්ට හා අනෙකුත් සාමාන්‍ය වැසියන්ට එරෙහි උල්ලංගනයන්හි යෙදෙති. මෑතකදී කෙරුණු සටන් විරාම ගිවිසුම අහෝසි කිරීම හා අනතුරුව නෝර්වීජියානු නායකත්වයෙන් යුතුවූ ශ්‍රී ලංකා සටන් විරාම නිරීක්ෂණ කමිටුව (SLMM) ඉවත්ව යාම නිසා අන් කවරදාකටත් වැඩියෙන් ස්වාධීන මානව හිමිකම් නිරීක්ෂණ ක්‍රමයක් ස්ථාපිත කිරීම අද වඩාත්ම අත්‍යාවශ්‍යව තිබේ.

විවිධ සන්නද්ධ බලඇණි හා කණ්ඩායම් විසින් කරනු ලබන අපරාධ ක්‍රියා හේතු කොටගෙන ශ්‍රී ලංකාව පුරාම ඔවුන්ගේ ආරක්ෂාව හා අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමේ පුළුල් ජාලයකට ළමුන් මුහුණ පා සිටිති "ආරක්ෂාව ද නැත, ගැලවීමක් ද නැත : ළමුන් සහ ශ්‍රී ලංකාවේ උත්සන්න වන සන්නද්ධ ගැටුම" වොච්ලිස්ට් විසින් කරනු ලබන වාර්තාව මෙම තත්ත්වය විදහා දක්වන අතර ශ්‍රී ලංකාවේ ළමුන්ගේ ආරක්ෂාව සඳහා අවශ්‍ය කරන හදිසි කාර්යයන් සම්බන්ධ ප්‍රායෝගික නිර්දේශයන් ද ඉදිරිපත් කරයි.



UNICEF/HQ06-1599/Shehzad Noorani



Watchlist



UNICEF/HQ06-1594/Shehzad Noorani

## සරණාගතයන් හා අභ්‍යන්තරව අවතැන් වූ පුද්ගලයන්

ප්‍රචණ්ඩ ගැටුම් යළි ආරම්භ වීමත් සමග 2006 අප්‍රේල් සිට 2007 අප්‍රේල් අතර කාලය තුළ ශ්‍රී ලංකාවෙහි 30,0000 කට වැඩි ජනතාවක් අවතැන්වී ඇති අතර 20,000 කට වැඩි පිරිසකට ඉන්දියාවේ ආරක්‍ෂාව පැතීමට බලකෙරි ඇත. ආසන්න වශයෙන් 2006 අප්‍රේල්වලට පෙර ශ්‍රී ලාංකිකයන් 500,000 අවතැන්වී ඇතී අවතැන් වූ ජනගහනයෙන් ආසන්න වශයෙන් සියයට 39 ක් ළමුන් වේ.

ප්‍රමාණවත් නොවන සනීපාරක්ෂ තත්ත්වයන් සහ හානියට පත් සෞඛ්‍ය පහසුකම් මෙන්ම ප්‍රමාණවත් නොවන සත්කාරක ප්‍රජාවන් හා අභ්‍යන්තරිකව අවතැන් පුද්ගල කඳවුරුවල පවතින ආහාර සැපයුම්වල හීඟයේ ප්‍රතිඵලයක් ලෙස අභ්‍යන්තරිකව අවතැන්වූ පුද්ගලයන් බෙහෙවින් පීඩා විඳිති. කඳවුරු තුළ මෙන් ම අවට පවතින ආරක්ෂක ඌනතාවය ළමුන්ව පැහැර ගැනීමට, බලයෙන් සන්නද්ධ ක්‍රියාවට බඳවා ගැනීමට හා ලිංගික හිංසනයට ද අනාවරණය කර තිබේ. ඇතැම් අභ්‍යන්තරිකව අවතැන්වූ පුද්ගලයන්ගේ කඳවුරු මිලිටරි ප්‍රහාරයන්ගේ සෘජු ඉලක්ක බවට පත්ව ඇත. ඒ හා සමානවම ඉන්දියාවේ ජීවත්වන ශ්‍රී ලාංකික සරණාගතයන් ද ජීවත් වනුයේ දුෂ්කර තත්ත්වයන් යටතේ ය. ඉන්දියානු ආණ්ඩුව විසින් අවම පහසුකම් ලබා දුන්න ද සරණාගත කඳවුරුවල බොහොමයක් ජීවත් වන්නේ 1980 ගණන්වල සිට 1990 ගණන් දක්වා යල් පිනූ යටි ව්‍යූහයන් තුළ ය. ඊට අමතරව කඳවුරුවලින් පිටත ජීවත්වන 23,000 ක් පමණ වන ශ්‍රී ලාංකික සරණාගතයන් කිසිදු සහනාධාරයකට හිමිකම් නොමැත.

ඇතැම් ශ්‍රී ලාංකික ළමුන් හැදී වැඩී ඇත්තේ අභ්‍යන්තරික අවතැන්වූ පුද්ගලයන්ගේ කඳවුරු හෝ සරණාගත කඳවුරු තුළ ය. අභ්‍යන්තරිකව අවතැන් වූ පුද්ගලයන් හා සරණාගතයන් සඳහා කල්පවත්නා විසඳුම් සෙවීම ප්‍රමුඛත්වයක් වන අතර ම මානුෂවාදී සංවිධාන මෑතදී බොහෝ අවතැන් වූ පුද්ගලයන් ආපසු යාම සැලකිල්ලට ගත්තේ සුදුසු තත්ත්වයක් ඇති නොවී ආපසු යාමක් ලෙස ය. එසේ ම අනාරක්ෂිත ප්‍රදේශවලට ආපසු යාමට දහස් ගණන් අභ්‍යන්තරිකව අවතැන්වූවන්ට බල කිරීම සම්බන්ධයෙන් මෙම සංවිධාන ශ්‍රී ලංකා ආණ්ඩුව විවේචනයට ලක් කර තිබේ. අභ්‍යන්තරිකව අවතැන් වූ පුද්ගලයන් සම්බන්ධව පැහැදිලි ප්‍රතිපත්ති හා සැලසුම් නොමැතිකම විවිධ කණ්ඩායම් අතර ප්‍රධාන වශයෙන්ම වාර්ගික මාර්ග ඔස්සේ ආතතීන් අවුස්සනු ලැබ ඇත.

## සෞඛ්‍යය

සන්නද්ධ ගැටුම, අවතැන්වීම හා මානුෂීය ආධාර බෙදාහැරීම මත පනවා ඇති සීමාවන් ශ්‍රී ලාංකිකයන්ගේ මන්ද පෝෂණයට හා රෝගවලට ගොදුරුවීමේ ශක්‍යතාව වැඩිකරවා තිබේ. ඊට අමතරව උතුරේ හා නැගෙනහිර බොහෝ සෞඛ්‍ය පහසුකම් හානියට පත් කරනු ලැබ හෝ විනාශයට පත් කරනු ලැබ තිබේ ලෝක ආහාර වැඩ සටහන (World Food Program) 2007 මැයිවලදී යාපනේ හා මඩකලපුවේ නැගී එන මානුෂවාදී හදිසි තත්ත්වයක් පිළිබඳව ද උතුරු නැගෙනහිර දිස්ත්‍රික්ක පහක තියුණු ආහාර හා ජීවිකා වෘත්ති අර්බුදයක් පිළිබඳව ද අනතුරු හැඟවීයි සිදුවෙමින් පවත්නා සන්නද්ධ ගැටුම හා ප්‍රවේශ සීමාවන් ගැටුමෙන් පරිපීඩිත ප්‍රදේශවල ජනයා ජීවිතාරක්ෂක වෛද්‍ය සුරැකුම්වලට ප්‍රවේශ වීමෙන් වළකා තිබේ. විශේෂයෙන් ම ළමෝ මේ තත්ත්වයන්ගෙන් පීඩා විඳිති.

## එච්අයිවී/ ඒඩ්ස්

එක්සත් ජාතීන්ගේ ඒඩ්ස් වැඩසටහනට අනුව 2005 අවසානය වන විට ශ්‍රී ලංකාවේ අවුරුදු 15 – 49 වයස් කාණ්ඩයේ ජනයා අතර එච්අයිවී ව්‍යාප්ති අනුපාතය පැවතියේ සියයට 0.1 ට අඩුවෙනි. එසේ වුව ද ශ්‍රී ලංකා ආණ්ඩුව ජාත්‍යන්තර හා දේශීය ආයතනවලට අනුව, ජනයා අතර විශේෂයෙන් ම වැඩිමහල් ළමුන් අතර දැනුවත් බව අඩුකම, ගර්භාවට පත්කරනු ලැබීම හා අනාරක්‍ෂිත ලිංගික සේවනය හේතුකොටගෙන එච්අයිවී තවදුරටත් පැතිරිය හැකි යැයි අනතුරු හඟවා ඇත. අධ්‍යාපන ක්ෂේත්‍රයේ සෞඛ්‍ය රක්‍ෂණය පිළිබඳ පුද්ගලයින් හා නිලධාරීන් පවා එච්අයිවී/ ඒඩ්ස්වලට භාජනයවූ පුද්ගලයන්ට වෙනස්කොට සලකන බව ප්‍රකටය. සන්නද්ධ ගැටුම සහ විපාක වශයෙන් ඇතිවන අවතැන්වීම හේතුවෙන් උතුරේ හා නැගෙනහිර වඩා වැඩියෙන් එච්අයිවී ව්‍යාප්තවන තත්වයන් නිර්මාණය කර තිබේ.

## අධ්‍යාපනය

ශ්‍රී ලංකාවේ සන්නද්ධ ගැටුම පාසල් යුද කඳවුරු බවට ද , අභ්‍යන්තරිකව අවතැන්වූ පුද්ගල කඳවුරු බවට හා හමුදා නිවස්න බවට ද හරවා තිබේ. 2006 දී නැවතත් සන්නද්ධ ගැටුම ඇතිවීම හේතුකොටගෙන ශ්‍රී ලංකා වේ 250,000 කට වැඩි ළමුන් සංඛ්‍යාවකට, වැඩිවශයෙන්ම උතුරේ හා නැගෙනහිර ළමුන්ට අධ්‍යාපනය තාවකාලිකව නවතා දැමීමට බලකෙරි ඇත. යුද ප්‍රහාර මගින් 2007 දෙසැම්බර් වන විට පැසල් 261 ක් හානියට හෝ විනාශයට පත්කර තිබෙන අතර අනාරක්ෂිත භාවය නිසා ඒවා යළි ඉදිකිරීම ද ප්‍රමාදවී ඇත. ගැටුමෙන් පරිපීඩිත ප්‍රදේශවල සිට මෑත වසරවලදී අධ්‍යාපන කාර්ය මණ්ඩලවල අය විශාල වශයෙන් පිටතට ගලායාම හේතුවෙන් උතුරු නැගෙනහිර බරපතල ගුරු හිඟයකට හේතුවී ඇත. ගැටුම් සහිත ප්‍රදේශවල විශේෂයෙන් අවතැන්වූ ළමුන් අතර සිසුන් පාසල් හැරයාමේ හා නොයාමේ අනුපාතය අසාමාන්‍ය වශයෙන් ඉහළ ය. පාසල් යන බොහෝ ළමුන් ගැටුම් සම්බන්ධ අත්දැකීම් හේතුකොටගෙන ඇතිවන මානසික පීඩාවේ ප්‍රතිඵලයක් ලෙස හෝ අධ්‍යාපනය වසර ගණනාවක් ඔවුන්ට අහිමිවීම නිසා හෝ විශේෂ අවධානයක් යොමුකිරිම අවශ්‍යව තිබේ.

## ස්ත්‍රී පුරුෂ සමාජභාව මූලික හිංසනය

ශ්‍රී ලංකාවේ ස්ත්‍රී පුරුෂ සමාජභාව මූලික හිංසනයට (Gender-based Violence / GBV) අදාළ ගැටුම් හා සම්බන්ධ සිද්ධීන් පිළිබඳ තොරතුරුවල හිඟයක් ඇත. මේ ප්‍රශ්නයේ ස්වභාවය හා පරාසය තක්සේරු කරගැනීම දුෂ්කර ය. කෙසේ වුව ද එහෙන් මෙහෙන් ලබාගත් තොරතුරු මගින් පෙන්නුම් කරන්නේ පවතින යථාර්ථ තත්වය පිළිබිඹු නොකරන බවය. සිදුවීම් වාර්තා නොකරනු ලබන්නේ ඒවාට පාත්‍ර වූවන් තුළ පවත්නා අපකීර්තියට පත්වීමේ හෝ ප්‍රතිවිපාකවලට ලක්වීමේ බිය හේතු කොටගෙන ද , ක්‍රමානුකූලව ලේඛනගත නොකරනු ලබන්නේ හෝ සුදුසු හා නිසි නෛතික, වෛද්‍ය හා සමාජ සේවාවන් වෙත ප්‍රවේශවීමේ අඩුවක් පවතින්නේ හෝ වුව ද සන්නද්ධ ගැටුම හේතු කොටගෙන ද ස්ත්‍රී පුරුෂ සමාජභාව මූලික හිංසනය පිළිබඳ සිදුවීම් වර්ධනය වී තිබේ යයි සිතන්නට පුළුවන.

මෙම ලියවිල්ල ආරක්ෂාව ද නැත ගැලවීම ද නැත: ශ්‍රී ලංකාවේ ළමුන් සහ උත්සාහවන්ත සන්නද්ධ ගැටුම යන වොච්ලිස්ට් (Watchlist) හි සම්පූර්ණ වාර්තාවේ සම්පිණ්ඩනයකි. සම්පූර්ණ වාර්තාව මූලික වශයෙන් පොදු පරිමණ්ඩලයෙන් (Public domain) ලබා ගත හැකි ද්විතීයික මූලාශ්‍රයන්ගෙන් ලබාගත් තොරතුරු පිළිබිඹු කරයි. තොරතුරු එකතු කරන ලද්දේ ලෝකය පුරා ළමුන් සමග වැඩ කළ විස්තීරණ සංවිධාන ජාලයක් ඔස්සේ ය. විශේෂඥතා දැනුමෙන් යුත් හා/ හෝ විශේෂිත සන්දර්භය තුළ අත්දැකීම් අති බහු ශික්ෂණ (Multidisciplinary) පුද්ගල කණ්ඩායමක් විසින් විශ්ලේෂණය සපයනු ලැබිණ. මෙම සම්පිණ්ඩනයෙහි හා සම්පූර්ණ වාර්තාවෙහි මුද්‍රිත තොරතුරු සම්බන්ධ මූලාශ්‍ර සම්පූර්ණ වාර්තාවෙහි අවසානයේ අකාරාදී පිළිවෙලට ලැයිස්තුගත කර ඇති ඇතැම් මූලාශ්‍ර රහස්‍ය වන අතර ඒවායේ ආරක්ෂාව රැකීම සඳහා ලැයිස්තුගත කර නැත. මෙම වාර්තාවේ අඩංගු චායාරූපයන්හි දක්නට ඇති පුද්ගලයන්ම ම, මානව හිමිකම් උල්ලංඝනයන් හෝ වෙනත් හිංසනයන්ට ලක්වූවන් හෝ දිවි ගලවාගත්තවුන් යැයි අනිවාර්යයෙන් සැලකිය යුතු නැත.



Watchlist



Watchlist

## යුද්ධයේ නෂ්ටාවශේෂ ලෙස බිම් බෝම්බ සහ පුපුරණ ද්‍රව්‍ය

2002 සටන් විරාම ගිවිසුමට පෙර එල්ටීටීඊය ද ශ්‍රී ලංකා ආණ්ඩුවේ හමුදා ද ගැටුම පුරාම පුද්ගල නාශක බෝම්බ (antipersonnel mines) විස්තීරණ ලෙස භාවිතා කරනු ලැබී ය. සිවිල් ජනයාගේ වාසස්ථාන ආසන්නයේ බිම් බෝම්බ අටවා තිබීම උතුරු නැගෙනහිර යුද්ධයට පාත්‍ර වූ ජනයාගේ ජීවිත අනතුරුදායක තත්ත්වයකට හෙළා තිබේ. 2006 බිම් බෝම්බවලින් හා යුද්ධයේ නෂ්ටාවශේෂයන්වන පුපුරණ ද්‍රව්‍ය හා බිම් බෝම්බවලින් හානියට පත් වූවන්ගෙන් සියයට 30 ක් ළමුන් යයි ගණනය කර තිබේ. බිම් බෝම්බවලින් ගහන වීමේ හේතුවෙන් මෙම ප්‍රදේශවලට ප්‍රවේශ වීමට ඇති අපහසුතාව මානුෂීය ආධාරවලට, ආර්ථික ප්‍රතිනිර්මාණයට හා අවතැන්වූ පුද්ගලයන්ට ඔවුන්ගේ නිවාසවලට ආපසු යාමට ද බාධා කර තිබේ. 2006 මැද භාගයේ ප්‍රචණ්ඩ ක්‍රියාවල ඉහළ නැගීමේ පටන් ආයතනවලට බිම් බෝම්බ ඉවත් කිරීමේ කටයුතු මන්දගාමී කිරීමට හෝ නතර කර දැමීමට පවා බල කෙරිණි සමහර අවස්ථාවල හමුදාව විසින් හිතාමතාම බිම් බෝම්බ ඉවත් කිරීමේ උත්සාහයන් වළකනු ලැබිණි මෑත වාර්තා පෙන්නුම් කරනුයේ එල්ටීටීඊය විසින් බිම් බෝම්බ යොදා ගැනීමේ ක්‍රියාවලිය අලුත් කර ඇති බව ය. මීට සාමාන්‍ය වැසියා මත මාරාන්තික ප්‍රතිවිපාක ගෙන දෙන කුප්‍රකට ක්ලේමෝ බොම්බ ද ඇතුළත් ය.

## සුළු අවි

නීති විරෝධී සුළු අවිවල සීඝ්‍ර වර්ධනය ශ්‍රී ලංකාවේ තිරසර සාමය ද ළමුන් හා ඔවුන්ගේ ප්‍රජාවන් සඳහා වන මානව සුරක්ෂිතතාව ද මුදුන් පමුණුවා ගැනීමට තිබෙන ප්‍රධාන බාධකවලින් එකක් බවට පත්ව ඇත. ස්වාධීන විශේෂඥයන් ගණනය කර ඇති පරිදි ශ්‍රී ලංකාවේ සංසරණය වන සුළු අවි ප්‍රමාණය දශ ලක්ෂ 1 සිට 2.4 දක්වා ප්‍රමාණයක් වේ. මේවා වැඩියෙන් ම හිමි කර ගෙන ඇත්තේ සිවිල් වැසියන් ය. සුළු අවි හා සැහැල්ලු අවිවල සීඝ්‍ර වර්ධනය වළකාලීමට දරණ ජාත්‍යන්තර ප්‍රයත්නයන්හිදී ක්‍රියාකාරී සහභාගිත්වයක් ලබා දිය යුතුව තිබියදීත් ශ්‍රී ලංකා ආණ්ඩුව තම පාලන ප්‍රදේශයෙහි නීති විරෝධී අවි සංසරණය අධීක්ෂණය කිරීමට හෝ පාලනය කිරීමට සමත් වී හෝ කැමත්තක් දක්වා හෝ නොමැත. එල්ටීටීඊය පැත්තෙන් ගත් කල එය රට තුළට ස්ථිරව සුළු අවි ප්‍රවාහයක් ගලා ඒම සහතික කරන කාර්යක්ෂම ජාලයක් යොදවා ගෙන තිබේ. යුරෝපා සංගමය මෙන් ම එක්සත් ජනපදය හා අනෙකුත් රටවල් ද එල්ටීටීඊය ත්‍රස්තවාදී සංවිධානයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇති අතර අවි සඳහා හා වෙනත් කටයුතු සඳහා මුදල් එකතු කිරීමෙන් වැළැක්වීමේ පියවර හඳුන්වා දී තිබේ.

## ළමා සොල්දාදුවෝ

වර්තමානයේ ශ්‍රී ලංකාවේ ළමෝ පැහැර ගනු ලැබීමේ, බඳවා ගැනීමේ හා ළමා සොල්දාදුවන් ලෙස යොදවා ගැනීමේ පැතිරුණු තර්ජනයකට මුහුණ දී සිටිති. ශ්‍රී ලංකා ආණ්ඩුව පාලනය කරන ප්‍රදේශ ද එල්ටීටීඊය පාලනය කරන ප්‍රදේශ ද යන්න නොතකා මෙය සිදු වේ ළමුන් බඳවා ගැනීම හා යොදා ගැනීම හා සම්බන්ධ අධිකාරිමය දත්ත මූලාශ්‍රය වන එක්සත් ජාතීන්ගේ ළමා අරමුදලේ (UNICEF) ළමුන් බඳවා ගැනීම පිළිබඳ දත්ත බැංකුව 2002 ජනවාරි සිට 2007 දෙසැම්බර් දක්වා එල්ටීටීඊය විසින් බඳවා ගන්නා ලද ළමුන් සම්බන්ධ සිද්ධීන් 6248 ක් ප්‍රලේඛනය කර (Document) ඇති මෙයට බොහෝ ගැහැණු ළමුන් ද ශ්‍රී ලංකා ආණ්ඩුවේ හමුදා සහය ද ඇතිව දෙමළ ජනතා විමුක්ති කොටි TMVP/කරුණා කණ්ඩායම විසින් 2004 අප්‍රේල්වල සිට 2007 දෙසැම්බර් දක්වා බඳවා ගන්නා ලද 453 ක් ද ඇතුළත් බව විශ්වාස කරනු ඇත. කෙසේ වුව ද එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල සුවිශේෂීය වශයෙන් දෙමාපියන් හා ප්‍රජාවන් ස්වෙච්ඡාවෙන් කරන ලද වාර්තා කිරීම් මත පදනම් වන නිසා සැබෑ ගණන් හිලව් මීට වඩා සැලකිය යුතු තරම් වැඩි විය හැකි ය.

ශ්‍රී ලංකා හමුදාවේ ඇතැම් කොටස්වල ආධාර ඇතිව දෙමළ ජනතා විමුක්ති කොටි TMVP/ කරුණා කණ්ඩායම ළමුන් බඳවා ගත් බවට එල්ල වෙන චෝදනා පිළිබඳව විශ්වාසනීය හා සම්පූර්ණ පරීක්ෂණයක් පවත්වනු වෙනුවට එසේ පරීක්ෂණ පවත්වන බවට දෙන ලද පොරොන්දු ද පසෙකලා ආණ්ඩුව කටයුතු කරයි. එල්ටීටීඊය හා TMVP/ කරුණා කණ්ඩායම යන දෙක ම මේ අපරාධයේ අඛණ්ඩ වගඋත්තරකරුවන් බවට එක්සත් ජාතීන්ගේ මහ ලේකම් විසින් නම් කරනු ලැබ ඇති වර්තමානයේ ළමුන් සඳහා විධිමත් නිරායුධකරණයක්, විසුරුවා හැරීමේ හා යළි පවුල්වලට ඒකාබද්ධ කිරීමේ ක්‍රියාවලියක් ඇත්තේ නැත. ශ්‍රී ලංකා ආණ්ඩුවට යටත් වෙනු ඇති ළමුන් ආරක්ෂා කිරීමේ හා පවුල්වලට යළි ඒකාබද්ධ කිරීමේ හෝ සන්නද්ධ කණ්ඩායම්වලින් ගැලවී පලා ඒමෙන් පසු ඔවුන්ගේ ආරක්ෂාව සැලසීමේ හෝ ප්‍රතිපත්තිවත් වැඩ සටහන් ද ඇත්තේ නැත.

## අනෙකුත් උල්ලංඝනයන් හා පහසු ගොදුරු බවට පත්වීමේ ශක්‍යතාවන්

ශ්‍රී ලංකාවේ ළමෝ, ළමා ජාවාරම, ළමා ශ්‍රමය, ගණිකා වෘත්තිය, අනාථාගාරවල අපයෝජනය, හිතුවක්කාර හා නීති විරෝධී අත්අඩංගුවට ගැනීම් ඇතුළු ඔවුන්ගේ ආරක්ෂාව හා අයිතිවාසිකම් සම්බන්ධ අනෙකුත් උල්ලංඝන දාමයකට අඛණ්ඩව මුහුණ දෙති. සන්නද්ධ ගැටුමට පෙර පවා ශ්‍රී ලංකාවේ ළමුන් මෙම උල්ලංඝනයන්ගේ ගොදුරු බවට පත්වීමේ තත්ත්වයක් පැවති අතර එහෙන් මෙහෙන් ලබාගත් තොරතුරුවලින් පෙන්නුම් කරන්නේ ගැටුම හේතු කොටගෙන එම සිදුවීම්වල වැඩිවීමක් ඇතිවී තිබෙන බව ය.

ළමුන් හා සන්නද්ධ ගැටුම් පිළිබඳ ක්‍රියාකිරීමෙන්, සන්නද්ධ ගැටුම් තුළ ළමුන්ට එරෙහිව සිදුවන හිංසනයන් නිම කිරීමට ද ඔවුන්ගේ අයිතිවාසිකම් සහතික කිරීමට ද වොච්ලිස්ට් ප්‍රයත්න දරයි ගෝලීය ජාලයක් ලෙස වොච්ලිස්ට් ජාලය අන්‍යොන්‍ය ශක්‍යතාවන් හා ශක්තීන් වැඩිදියුණු කරමින් ප්‍රාදේශීය, ජාතික හා ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන අතර හවුල්කාරීත්වයන් ගොඩනගයි එක්ව වැඩ කරමින් අපි ළමුන් ප්‍රතිඵලදායී ලෙස ආරක්ෂා කරන වැඩසටහන් හා ප්‍රතිපත්ති නිර්මාණය කිරීමට හා ක්‍රියාවට නැගීමට ප්‍රධාන තීරණ ගනු ලබන්නන්ට බලපානු පිණිස ගැටුම් තුළ ළමුන්ට එරෙහිව කෙරෙන හිංසනයන් පිළිබඳව මූලෝපායික වශයෙන් තොරතුරු එක්රැස්කර බෙදා හරිමු.

ආරක්ෂක මණ්ඩලය විසින් සම්මත කළ 1261, 1314, 1379, 1460, 1539 හා 1612 යන යෝජනාවන්ගේ විධිවිධානවල ද ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තියේ හා එයි වෛකල්පික මූල ලේඛනයන්හි ද ජාත්‍යන්තර වශයෙන් පිළිගනු ලැබ ඇති අනෙකුත් මානව හිමිකම් හා මානුෂවාදී ප්‍රමිතීන්ගේ මූලධර්මවල ද රාමුව ඇතුළත වොච්ලිස්ට් ජාලය කටයුතු කරයි.

වොච්ලිස්ට්හි පොදු අධීක්ෂණය කරනු ලබනුයේ ළමුන් හා මානව හිමිකම් පිළිබඳව ක්‍රියා කිරීම සම්බන්ධයෙන් ප්‍රකට ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධානවල මෙහෙයුම් කමිටුවක් විසිනි. මෙම වාර්තාවේ ඉදිරිපත් කරන අදහස් ජාලයේ කිසියම් එක් සංවිධානයක හෝ මෙහෙයුම් කමිටුවේ හෝ අදහස් නියෝජනය නොකරයි.

**watchlist.org**

## හදිසි නිර්දේශ

ආරක්ෂාව ද නැත ගැලවීමක් ද නැත යන වාර්ත්තාව, ශ්‍රී ලංකා ආණ්ඩුවට; එල්ටීටීඊයට; ටීඑම්වීපීයට/ කරුණා කණ්ඩායමට; එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයට; ශ්‍රී ලංකාවේ 1612 කාර්ය සාධක බලකායට; ශ්‍රී ලංකාවේ මානවවාදී ප්‍රජාවට; ප්‍රදානකයන්ට සහ අනෙකුත් ආණ්ඩුවලට හදිසි නිර්දේශ මාලාවක් ඉදිරිපත් කරයි. ප්‍රාථමික වැදගත්කමක් ඇති දේ වනුයේ ශ්‍රී ලංකාවේ සියලුම හමුදා හා සන්නද්ධ කණ්ඩායම් වහාම ළමුන්ට එරෙහිව කරන උල්ලංඝනයන් නතර කළ යුතුය යන්න ය. අතිරේක වශයෙන් සියලුම ක්‍රියාකාරක පාර්ශවකරුවන් ශ්‍රී ලංකාවේ ළමුන් තවදුරටත් අපයෝජනයට ලක් කිරීමෙන් ආරක්ෂා කිරීමට හා සන්නද්ධ ගැටුමේ දශක ගණනාවක ප්‍රතිවිපාකවලින් පීඩාවට පත්ව සිටින්නවුන්ට සහාය හා ආධාර කිරීමේ මාර්ග සොයා ගැනීමට කඩිනම් පියවර ගත යුතු ය.

## වොච්ලිස්ට් (Watchlist) වාර්තාවෙහි අඩංගු ප්‍රධාන නිර්දේශ වන්නේ පහත සඳහන් ඒවා ය

- ගැටුමට සම්බන්ධ සියලු පාර්ශව සියලු ජාත්‍යන්තර සම්මුතීන්ට තදින් බැඳී සිටිය යුතු අතර ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රතිපත්තියට හා එහි වෛකල්පික මූල ලේඛයන්ට විශේෂ අවධානයක් යොමු කරමින් ජාත්‍යන්තර මානව හිමිකම් හා මානුෂවාදී නීතිය අනුගමනය කළ යුතු ය. ශ්‍රී ලංකා ආණ්ඩුව එක්සත් ජාතීන්ගේ අනුග්‍රහය යටතේ ජාත්‍යන්තර මානව හිමිකම් හා මානුෂවාදී නීතිය සම්බන්ධ සියලු උල්ලංඝනයන් පරීක්ෂා කිරීම හා වාර්තා කිරීම සඳහා වගකිවයුතු ස්වාධීන මානව හිමිකම් නිරීක්ෂණ දූත මණ්ඩලයක් පිළිගත යුතු අතර ඒ සමග සම්පූර්ණ සහයෝගයෙන් වැඩ කළ යුතු ය.

- ශ්‍රී ලංකා ආණ්ඩුවේ අධිකාරීන් ශ්‍රී ලංකාව මුළුල්ලේ ළමුන් සඳහාවන අධ්‍යාපන, සමාජ හා සෞඛ්‍ය සේවා ප්‍රතිපාදනයන්හි පවත්නා අසමතුලිතතාවන්ට ආමන්ත්‍රණය කිරීමට කේන්ද්‍රීය අවධානයක් යොමු කරමින් අයවැයෙහි සමාජමය – යොමුවකින් යුත් වියදම් වැඩි කළ යුතු ය. එසේ ම ශ්‍රී ලංකා ආණ්ඩුව ශ්‍රී ලංකාවේ ළමුන්ගේ ආරක්ෂාව හා අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ ප්‍රතිපත්ති සියලු ආණ්ඩු ආයතනයන්හි අත්‍යවශ්‍ය කොටසක් ලෙස සහතික කළ යුතු ය.

- ශ්‍රී ලංකා ආණ්ඩුවේ අධිකාරීන් TMVP/ කරුණා කණ්ඩායම විසින් කරන ලද ළමුන් බඳවා ගැනීමට හා/හෝ පැහැර ගැනීමට ආධාර කිරීමෙහිලා ශ්‍රී ලංකා ආරක්ෂක හමුදාවන්ගේ මැදිහත්වීම පිළිබඳ පූර්ණ හා විශ්වාසනීය පරීක්ෂණයක් වහාම කළ යුතු අතර අපරාධවලට වගකිව යුත්තන්ට දඬුවම් පැමිණවිය යුතු ය.

- ශ්‍රී ලංකා ආණ්ඩුවේ අධිකාරීන් සහ එල්ටීටීඊය මානුෂවාදී ක්‍රියාකාරකයන්ට ශ්‍රී ලංකාවේ සියලුම ප්‍රදේශවලට සීමා නොකරන ලද හා ආරක්ෂා සහිත ප්‍රවේශය සැලසිය යුතු අතර සියලු සිවිල් වැසියන්ට මානුෂවාදී ආධාර සඳහා ආරක්ෂා සහිත, අවහිරයෙන් තොර හා තිරසර ප්‍රවේශය සැලසිය යුතු යි මෙයට මානව හිමිකම් ආරක්ෂකයින් ආරක්ෂා කරනු ලැබීම හා මානව හිමිකම් උල්ලංඝනයන් සම්බන්ධයෙන් මහජන අවධානය ඇති කිරීමට දරණ ප්‍රයත්නයන්ට ආධාර කරනු ලැබීම සහතික කිරීම ද ඇතුළත් වේ.

- එල්ටීටීඊය බදු අය කිරීම, සිවිල් වැසියන් විශේෂයෙන් ළමුන් බලහත්කාරයෙන් බඳවා ගැනීම, වන්නි ප්‍රදේශය තුළට හා පිටතට යාමෙන් ඒමෙන් සිවිල් ජනයා වළක්වන ප්‍රාදේශීය අවසර පත්‍ර ක්‍රමයක් නිර්මාණය ඇතුළු සිවිල් වැසියන් උගුලට අසුකර ගැනීම හා සම්බන්ධ අයිතිවාසිකම් පිළිබඳ සියලු උල්ලංඝනයන් නැවතිය යුතු ය.

- එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලය එල්ටීටීඊයට සහ TMVP/ කරුණා කණ්ඩායමට ළමුන් බඳවා ගැනීම හා යොදවා ගැනීම අවසන් කිරීම දැඩි හා සීමා සහිත කාල වකවානුවක් තුළ සම්පූර්ණ කළ යුතු ය  යන පැහැදිලි කාල සීමා ක්‍රියා නීර්ණයන් ලබා දිය යුතු ය. මෙම කාල සීමා ක්‍රියා නීර්ණයන්ට අනුව ක්‍රියා නොකළේ නම් ආරක්ෂක මණ්ඩලය ආයුධ සම්බාධක, සංචාරක සීමාවන් වැනි ඉලක්කගත පියවර ක්‍රියාවට නැගිය යුතු ය.

- එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලය ශ්‍රී ලංකාවේ සියලු ප්‍රදේශවල සන්නද්ධ ගැටුමේ ප්‍රතිවිපාකයන්ට ගොදුරුවූ ළමුන් ගේ තත්වය පිළිබඳ අවධානය යොමු කිරීමට, උල්ලංඝනයන් පිළිබඳ චෝදනා පරීක්ෂා කිරීමට, ශ්‍රී ලංකාවේ අධීක්ෂණ හා වාර්තා කිරීමේ යාන්ත්‍රණය මගින් ඇති කරනු ලබන ප්‍රගතිය විමර්ශනය කිරීමට හා ආරක්ෂක මණ්ඩලය විසින් ගත යුතු තවදුර පියවර සඳහා නිර්දේශ ඇතුළත් විස්තීරණ වාර්තාවක් ඉදිරිපත් කිරීම මගින් පසු විපරම් කිරීමට (පාර්ශවීය වශයෙන් බලපෑමට ලක්වූ ප්‍රදේශ ද ඇතුළත්ව) ක්ෂේත්‍ර කාර්යභාරයක යෙදෙනු සඳහා එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයේ ළමුන් හා සන්නද්ධ ගැටුම් පිළිබඳ කාර්ය කණ්ඩායමේ නියෝජිත පිරිසක් ලංකාවට එවිය යුතු ය.

- ප්‍රදානකයන් ඇතුළු මානුෂවාදී ප්‍රජාවේ සාමාජිකයන් විශේෂයෙන් ම හිටපු ළමා සොල්දාදුවන්, අභ්‍යන්තරිකව අවතැන්වූ පුද්ගලයන්, හුදෙකලා සහ වෙන්ව ජීවත්වන ළමුන්, ස්ත්‍රී පුරුෂ සමාජභාවය මූලික හිංසනයන්ට පාත්‍රවූවන් හා හිංසනයේ හා සූරාකෑමේ වඩා ඉහළ අවදානම්වලට මුහුණ දිය හැකි අනෙකුත් අය ඇතුළු ශ්‍රී ලංකාවේ ළමුන්ට රක්ෂාවරණය හා සහාය දෙන වැඩ සටහන් ශක්තිමත් හා ව්‍යාප්ත කළ යුතු ය.

- ප්‍රදානක රටවල් හා ආයතන පැතිර තිබෙන මානව හිමිකම් අපයෝජනයන් හා සන්නද්ධ ගැටුම යළි ආරම්භවීම සැලකිල්ලට ගනිමින් ආධාර පිළිබඳ කොන්දේසිදායකත්වය ද ඇතුළුව නව ප්‍රවේශයන් සාකච්ඡා කිරීමට ප්‍රදානක සමුළුවක් කැඳවිය යුතු ය. සමුළුව සිවිල් වැසියන්ගේ ආරක්ෂාව හා මානුෂවාදී මුලපිරුම් සඳහාවන සහයෝගය වැඩි දියුණු කිරීම ද මානුෂවාදී මූලධර්ම යොදා ගනු ලැබීම සහතික කිරීම ද ඉලක්ක කළ යුතු ය. එසේ ම එය ශ්‍රී ලංකා ආණ්ඩුව සමාජ සේවා සඳහා තමන්ගේ ම මූල්‍ය ප්‍රතිපාදන වැඩි කිරීමට හා දරා ගැනීමට දිරි ගැන්විය යුතුය.

- ශ්‍රී ලංකාවේ ප්‍රධාන වෙළෙඳ හවුල්කරුවන් විශේෂයෙන් ම යුරෝපීය සංගමය සහ ආසියා පැසිපික් ආර්ථික සහයෝගීතාවේ (APEC) සාමාජිකයන් ශ්‍රී ලංකා ආණ්ඩුව ජාත්‍යන්තර මානුෂවාදී හා මානව හිමිකම් නීතිය යටතේ ළමුන්ට රැකවරණය දීමට එහි ඇති කැපවීම හා බැඳීම ක්‍රියාවට නැගීම සහතික කරනු සඳහා යෙදවිය හැකි සියලු මාධ්‍යය උපයෝගී කරගත යුතු ය.

**Watchlist on Children and Armed Conflict**
c/o Women's Commission for
Refugee Women and Children
122 East 42nd Street, 11th floor
New York, NY 10168-1289
Phone: 212.551.2941
Fax: 212.551.3180
Email: watchlist@womenscommission.org
වාර්තාව ලබාගැනීමට : www.watchlist.org

වොච්ලිස්ට් හෝ විශේෂිත වාර්තා පිළිබඳව හෝ විශේෂ ගැටුම්කාරී තත්වයක් තුළ ළමුන් පිළිබඳ තොරතුරු හුවමාරු කර ගැනීමට කරුණාකර **watchlist@womenscommission.org** සම්බන්ධ කරගන්න.


UNICEF/HQ06-1583/Shehzad Noorani